

# අකාරුණික යුද්ධය

මුදූ වෙරළ වසාගෙන
කළු දියර එලාගෙන
සිප හැපී රළ පහර
රතු දියර දොවාගෙන
ගලන්නේ
අහිංසක මිනිසුන්ගෙ
පන ගැහෙන හදවතින.

මරනයේ දූගඳ ඔසවා සුළඟ
බීතියෙන් පැන දූවන
පාළු මාවත දිගේ
බඩගගා
නොමළ මිනිසුන් සොයන
බිඳවැටුනු නගරයක..
තනි උකුස්සෙක්
අහස නැගීලා වල්මත්ව
මොරදිදී කියන්නේ
ගොදූරු හමුවූ බවක් නොවේ අද
යුද්ධයේ භීෂණය
එහි අසාධාරනය.

පිපිරෙනා වෙඩි හඬම පමනකිය ඇසෙන්නේ
කළු අඳූරු දූම් කඳය නැගෙන්නේ
මිනිස් පුළුටක් නැතිය සුන්බුන්ම පමනකිය
නගරයේ හැම තැනම පෙනෙන්නේ

උකුස්සෝ උඹේ හඬ අසන්නට
වෙනත් කුරුලෙකු නැතිය ඉතිරිවී
වෙරළ මත හැපී කිම
ගලන් මුදූ ලෙසින් රළ
නොමළ දරුවෙක් තනිව ඉකිබිඳී.

චන්ද්‍රිකා ද සිල්වා

# මපුතු කොතැනද?

*88/89 භීෂණ සමයේදී සිය කුළුදුල් පුතු යුද හමුදාව විසින් ඝාතනය කරනු ලැබීමෙන් පසු සිය පියා නොදුටු තම පුතුගේ පුතු හදාවඩා ගන්නා විශ්‍රාමික ගුරු මාතාවක විසින් රචිත කවකි*

*පාට පාට සරුංගලේ කොයිබද ඔබ යන්නේ*
*සුළං අතට පෙරලි පෙරලි ඇයි ඔබ ඇඹරෙන්නේ*
*කඳුළු සෙමින් ගලා ඇවිත් මා නෙතු තෙත් වන්නේ*
*පුංචි පුතා මගෙන් වෙන්ව දැන් ඈතයි ඉන්නේ*
*සරුංගලේ වෙල් එළියේ ඔහු රුව සොයපන්නේ*

*පොත් බෑගය තුරුළු කරන් පාසල වෙත ඇදෙනා*
*අම්මා කියමින් අමතා මා තුරුලේ හිඳිනා*
*පිය සෙනෙහස අහිමි පුතේ ඔබ කොහිදැයි නොදැනා*
*සිහිල් සුළං හමා ගියත් අද මගෙ සිත දැවෙනා*

*ගෙදර එළිය කළ පහනයි ඈතින් දිස්වන්නේ*
*අඳුර ගලා විත් නිවෙසේ පාළුව පැතිරෙන්නේ*
*පුතා නැතිව ඉවසුම් නෑ හදට රිදුම් දෙන්නේ*
*සරුංගලේ මපුතු අරං මෙහි පා වී එන්නේ*

කාන්ති වීරරත්න
කඩවත

# තීරණය

උදය ආර්. තෙන්නකෝන්

මධ්‍යම රාත්‍රිය
අවදියෙන්
කිසිදින
මෙතරම් හඬින් නෑසුන
තත්පර කටුව
බිත්තිය මත
මා හා සටනක...

අතීතය භාරා අවුස්සයි
පොර බදයි
පරාජය කරනට
කැස කවයි

නින්දට ගියද
ඉඩ නොදෙයි

මැදිවිය
පසුකර ගොස්ය

නැවතත්
වැඩට බැස්සෙමි

තත්පර කටුව
නිහරෑයි....

# පහන් වැට

## කොන්දොස්තර සහ උසස් පෙළ

***උසස් පෙළ ලියන සිසුන්ට නොමිලේ බස්වල යාමට වරම් - පුවතක්***

| | |
|---|---|
| දෑඟිලි මතට හිරවුනු මොනරුන්ගේ | කොලේ |
| හෝඩි පොතේ හිටි මොනරා නොවෙයි | මලේ |
| උසස් වෙන්න ලිව්වත් ඇති කිමද | පලේ |
| ලිව්ව දෑත් බසයක හිරවෙලා | මලේ |
| | |
| සමීකරණ දත්ත විරිත්තලා | ගියේ |
| ශුද්ධ ගණිතෙ ටිකට් පොතේ සිරව | ගියේ |
| කාච කිරණ නාභිය මත නොවැදි | ගියේ |
| ඒකයි මා බසයක කොන්වෙලා | ගියේ |
| | |
| කෑගහලා ඉල්ලපු දේ සුළඟෙ | ගියේ |
| ගෑස් බිංදු කඳුලක සැඟවිලා | ගියේ |
| සහතික කොළ සුළඟක පා වෙලා | ගියේ |
| සිල්ප සතර සිරවී බසයකට | ගියේ |
| | |
| සැමදා අතට සිරවෙන කොල දිහා | බලා |
| ඇඟිලි පුරුක් මත ගණිතය කැබලි | වෙලා |
| දූවිලි පොලොවෙ කැරකෙන ටයරයක් | පලා |
| පරිධිය මඬේ සිරවෙයි හඬවමින් | නලා |
| | |
| හඳමාමා පෙන්නා අම්මා | කැව්වා |
| බත්කට වගෙ නොවෙයි රස නැහැ මේ | ගව්ව |
| රවටා නලවමින් පෙන්වන | සැරසිල්ල |
| ටික කලටයි ගන්නා තුරු | නරබිල්ල |
| | |
| කිව්වත් නැතත් මම මල්ලියෙ දෙනවා | වරම් |
| නොමිලේ උඹ උසස් පෙළට යනවා | අරන් |
| පාස්වෙලා නුඹ එනවිට ලකුණු | අරන් |
| මම එන්නම් තුටු උතුරන කඳුළු | අරන් |
| | |
| සමනළ සිහින මැව්වත් සහතික | ගොන්න |
| සිහිනය නොවෙයි ජීවිතයට | බඩගින්න |
| ජීවන මග බස් රථයට | ගොඩවෙන්න |
| පාඩම් ගොඩක් ඇත බුද්ධිය | කරගන්න |

ලක්ෂ්මන් කොඩිතුවක්කු

# උපා දන්නා අපායේ නොවැටේ

*-ඊයෙත් උදේ උඹ මට*
*හමු උනා නේ ටව්මෙදි*
*ඇය් ඉතින් නිකමටවත්*
*නො කීවේ මේ වගක් මට*

*තංගල්ලට බැඳපු*
*ලොකු නංගි ඊයේ හවස*
*මෙහේ ආවා නේ අපෙන්*
*අතමාරුවක් කර ගන්න*

*ඒ ගොල්ලෑ වාහනයක්*
*ගන්න යනවලු අද හෙට*
*රුපියල් හැට දෙ දහක්*
*ඕනලු ඒක ගන්නට*

*ලග තියන පනහට*
*තව දො ලහක් අඩුලු*
*ඉල්ලුවා නේ අපෙන්*
*රුපියල් දො ලොස් දාහක්*

*හද්දාස් පන්සීයක්*
*අය්යා ගාව තිබුනා*
*මා ලගත් තිබුනා*
*තුන්දාස් පන්සීයක්*

*ඔක්කොම එකතු කරලා*
*එකොලොස් දහක් දුන්නා*
*අපි දැං ඉන්නවෑ උඩ බලං*
*ඉතිං ඒවත් නොකර බෑනේ !"*

*වත්ත බද්දට දීලෑ*
*දත නියවන්න ඇස්සට*
*සිද්ද වේවි ද කියලෑ*
*අපිත් ඉන්නේ දෙගිඩියාවෙං*
*තරහ වෙන්නට නං එපා*
*ඕකය් වෙච්ච සිද්දිය*
*තඹ දොයිතුවක් වත් නෑ*
*බේතකට ගෙන්නවත් අප ලග*

*අම්මාපල්ල ඇත්තය්*
*උඹට හින්දය් කීවේ*
*වෙන විදියකට උඹ අද*
*ඔය ගනුදෙනුව කරගනිං"*

*-තරහ වෙන්නේ මොටද ?*
*කිසි ම දවසක උඹ මට*
*ලග තියා ගෙන නෑ බෑ*
*නොකී බව මං දන්නවා නේ !*

*ඕං මං යනවා*
*පස්සෙ දවසක හමු වෙමු"*
*මිතුරා හිස් අතින්*
*වෙනඅතක් ගැන හිතමින්*

*-අය්යා දැම්ම යනවෑ ද*
*බැංකුවට අද සිකුරාදා ?*
*යනවෑ නං මේ තිස්දහත්*
*මගේ ගිනුමට දාන්න"*

*-සිරිපාලයා දැං*
*හතරහටම නය වෙලා*
*නයක් දුන්නොත් නං*
*ආපසු ලැබෙනවා බොරු"*

*වි.ක. ධර්මබන්ධු*